


විදුදය

භාෂා, සාහිත්‍ය, සංස්කෘතික හා මාධ්‍ය අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

VIDUDAYA

Journal of Language, Literary, Cultural and Media Studies

Department of Sinhala and Mass Communication, University of Sri Jayewardenepura

2026, 05 (01): 19-34

ISSN: 3051-5424

Journal homepage: https://journals.sjp.ac.lk/index.php/vidudaya

# කතළුව පූර්වාරාමය: බිතු සිතුවම් පිළිබඳ අධ්‍යයනයක්

පූජ්‍ය පදියතලාවේ අමරවංශ හිමි

සිංහල අධ්‍යයන අංශය
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
padiyathalaweamarawansa933@gmail.com

## Abstract

Purvaramaya is located in Habaraduwa Regional Secretariat Kathaluwa in Galle District of the Southern Province. Paintings of the lowland tradition of the Kandy period belonging to the 18th and 19th centuries can be seen in this temple. We can see the old the shrine, the Darmashala, the Chethiya, and a Bodhi tree. The Vihara Mandir is built in the middle of Vihara Malu on a high ground about one meter. The purpose of the research is to study how the special characteristics of the paintings of the southern province of the painting tradition of the Kandy period are included in the paintings of the Kataluva Purvarama. The observational study method was specially used to collect the information. Also, primary source study and secondary source study were used. The research problem was to investigate the contemporary society represented by the paintings of the Kataluva Purvarama and to examine the significance of the paintings. Graphical analysis, thematic analysis and qualitative analysis were used to investigate the information. The artist has chosen Jataka stories for temple paintings and famous stories mentioned in Buddhist literature for news paintings to give examples to the society. It was possible to conclude that the object is to create a society where good people live. The objectives are to save the Buddhist people from culture, to protect Buddhism and to continue the fellowship of the temple. Also, getting used to donating has become the purpose of the paintings. All the special features of the low country Kandy painting tradition can be seen in these temple paintings

**Keywords -** Culture, Purvaramaya, Painting Tradition, Religious stories, Society

## 01. හැඳින්වීම

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවේ හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොග්ගලටත් අහංගමටත් අතර කතළුව පූර්වාරාමය පිහිටා තිබේ. මාතර නගරයේ සිට පැමිණෙන්නේ නම් කොළඹ-මාතර ප්‍රධාන මාර්ගයේ කිලෝමීටර් දහ අටක් පමණ කොළඹ දිශාවට පැමිණිය යුතු වේ. ප්‍රධාන මාර්ගයේ සිට කිලෝමීටරයක් ඇතුළට ගමන් කළ විට විහාරයට පිවිසිය හැකි ය. මෙම විහාරයේ ඇත්තේ දහඅට වන සහ දහනව වන සියවස්වල මහනුවර යුගයට අයත් පහත රට චිත්‍ර සම්ප්‍රදායේ සිතුවම් ය.

'කතළුව' ග්‍රාම නාමයේ සම්භවය සම්බන්ධයෙන් ජනප්‍රවාද කිහිපයක් පවතියි. ජනප්‍රවාදයකට අනුව හුරුබුහුටි කතුන් විසූ ගම යන අදහසින් කතළුව වූ බවත් එය කටලුව>කටලූව>කතලුව වූ යනුවෙන් සැකසුණු බවත් පැවසේ. කිතුල් ඇති ගම යන අදහසින් කාතාලගාම>කතළුගම>කතළුව වූ බවත්, කත දවා ලූ ගම යන අදහසින් කතලුව වූ බවටත් තව මත ඉදිරිපත් ව තිබේ (මහින්ද හිමි, 2007:79-80). වෙළෙඳාමෙන් ජීවත් වූ ගම්වැසියන් බර අධික භාණ්ඩ කදෙකින් වෙළඳපොළට ගෙන ගිය නිසා විටින් විට කද බිම තබා විඩා සංහිඳුවා ගන්නට විය. කද බිම තබා විවේක ගැනීමට ඇබ්බැහි වී සිටි ගම්වැසියන් විසූ ගම අදහසින් කද ලූ හෙයින් කදලුව>කතළුව වූ බවටත් තවත් ජනප්‍රවාදයක් ඇත (මහින්ද හිමි, 2007:79-80).

මෙම විහාරය වල් බිහි වී තිබිය දී සොයාගෙන නැවතත් බෞද්ධයන් වෙත විවෘත කර ඇත්තේ කතළුවේ ගුණරතන හිමියන් විසිනි. ආරම්භක අවධියේ දී පිළිම ගෙය, දාගැබ හා ධර්ම ශාලාව ඉදිකර තිබේ. අනෙකුත් ඉදිකිරීම් පසුකාලීන ඒවා ය. කතළුවේ ගුණරතන හිමියන්ගෙන් පසු පිළිවෙළින් කතළුවේ සිරි අත්ථදස්සි හිමි, කතළුවේ සිරි සෝභිත හිමි, කතළුවේ සිරි පේමානන්ද හිමි, කතළුවේ සිරි පඤ්ඤාරංසි හිමි, කතළුවේ ශ්‍රී ධර්ම ශ්‍රී හිමි යන තෙරුන් වහන්සේ විහාරාධිපති තනතුරට පත් ව ඇත (ධර්ම ශ්‍රී, 1983:13-20).

උස් බිමක පිහිටි විහාර මලුවට ප්‍රවේශ වීමේ දී පළමුවෙන් ම හමුවන්නේ බෝධීන් වහන්සේ ය. එය පැරණි බවක් උසුලන අතර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාවේ එලරුහ බෝධියක් බවට ජනප්‍රවාදයක් පවතී. දාගැබ පිහිටා ඇත්තේ වර්තමානයේ දක්නට ලැබෙන සංඝාවාස භූමියේ සිට අඩි දහයක් පමණ උසින් වූ උඩමලුවේ ය. එය පරිවාර චෛත්‍ය හතරකින් සමලංකෘත ය. විශාල දාගැබ හා පරිවාර දාගැබ් සියල්ල නිර්මාණය කර ඇත්තේ ඝණ්ඨාකාර හැඩයෙනි. සිවුදිශාභිමුඛ ව මල් අසුන් හතරක් හා ඒ මත ඉදිකළ කුඩා පිළිම ගෙවල බුද්ධ ප්‍රතිමා හතරක් තැන්පත් කර තිබේ. උස් බිමක පිහිටි නිසා දාගැබ ඈතට හොඳින් දිස් වේ. සිතුවම් හා මූර්ති පිහිටි කලාගාරයක් වැනි පිළිම ගෙට ඉදිරියෙන් ඉපැරණි සීමාමාලකයක් දක්නට ඇත. කතළුවේ ගුණරතන හිමි බුරුමයේ දී උපසම්පදාව ලබා වැඩම කර ක්‍රි.ව. 1810 දී සාමණේරයන් වහන්සේ විසිනමක් උපසම්පදාවට පත් කරමින් කල්‍යාණිවංශ මහා නිකාය ලක්දිව ආරම්භ කර ඇත්තේ මේ විහාරයෙනි. අදටත් හොඳ තත්ත්වයකින් පවතින මෙම ගොඩනැගිල්ල අවුරුදු 214 ක් පැරණි ය. තව ද පැරණි සංඝාවාසයක නටබුන් ද සීමාමාලකයටත් විහාර මන්දිරයටත් නුදුරින් හමු වේ. සීමාමාලකයට ඉදිරියෙන් මඳක් වම් පසින් වන්නට පොළොව මට්ටමේ සිට අඩියක් පමණ උසින් ධර්ම ශාලාව පිහිටුවා තිබේ. ඉතා අලංකාර ව නිර්මාණය කර ඇති ධර්ම ශාලාවෙන් අවුරුදු සියයක පමණ ඉතිහාසයක් විද්‍යාමාන වෙයි. වර්තමානයේ සංඝාවාසය ඇත්තේ පහළ මලුවේ ය. ඉතා උස් වූ බිත්ති සහිත මේ සංඝාවාසය ද වසර සියයක් පමණ පැරණි ය. පිළිම ගෙය පිහිටා ඇත්තේ ඉහළ මලුවේ පොළොව මට්ටමේ සිට

මීටරයක් පමණ උසින් ය (බලන්න, ඡායාරූප ඵලකය අංක 01). වේයන්ගෙන්, කෘමි සතුන්ගෙන් හා වෙනත් සර්ප ආදි උරග සතුන්ගෙන් විහාරයට වන බලපෑම වළක්වා ගැනීමටත්, විහාර ගෙය සෙසු ගොඩනැගිලිවලින් මතු කර පෙන්වීමටත් අවශ්‍ය වූ බැවින් මෙතරම් උසකින් ගොඩනැගිල්ල පිහිටුවන්නට ඇතැයි සිතිය හැකි ය. විහාරයට ප්‍රවේශ වීම් දොරටු පහක් දක්නට ඇත. ප්‍රධාන දොරටුව පිහිටුවා ඇත්තේ සීමාමාලකය දෙසට හා ගමට මුහුණ ලා ය. ප්‍රධාන දොරටුවට දෙපසින් බිත්තිවල පියන් දෙකේ ජනෙල් දෙකක් ඇත. වම් පැත්තට හා දකුණු පැත්තට දෙක බැගින් අනෙක් දොරටු හතර පිහිටුවා තිබේ. විහාරය සම සතරැස් ආකාරයෙන් ද වහලය උළු සෙවිලි සහිත ව එල්ල බෙදෙන වහලවලින් ද අලංකාර ලෙස නිර්මාණය කර තිබේ. විහාරයේ සිට බලන විට බෝධිය පිහිටා ඇත්තේ විහාරයට පිටුපසින් ය. දාගැබ විහාරයට වම්පසින් හා ධර්ම ශාලාව දකුණු පසින් පිහිටුවා ඇත. පිළිම ගෙය ඉදිකර ඇත්තේ විහාර භූමියේ හරි මැද යි. විහාරයේ ප්‍රධාන ප්‍රවේශ දොරටුව පිහිටි මුදුන් බිත්තියේ දොරට ඉහළින් ජෝජ් රජතුමාගේ හා එංගලන්ත රාජ්‍ය ලාංඡනය සමඟ 'ක්‍රිස්තු 1884' '1886 වරුෂ' යනුවෙන් කාලය දක්වා තිබේ (බලන්න, ඡායාරූප ඵලකය අංක 02). චිත්‍ර ඇඳි සමය මෙය ලෙස නිශ්චිතව සැලකිය හැකි වුවත්, ඊට වඩා පැරණි චිත්‍ර ද විහාරාභ්‍යන්තරයේ දක්නට ලැබේ.

## 02. ක්‍රමවේදය

පර්යේෂණයට අවශ්‍ය දත්ත සපයා ගැනීමේ දී මූලිකව ම අනුගමනය කර ඇත්තේ සහභාගීත්ව නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා අධ්‍යයන ක්‍රමය යි. තව ද ලබා ගත් දත්ත සුපරීක්ෂා කිරීම, සිතුවම් සංකල්ප හඳුනා ගැනීම, කතළුව පූර්වාරාම ඉතිහාසය ආදි තොරතුරු අධ්‍යයනයට හා පර්යේෂණය සාර්ථක කර ගැනීමට මහාවංසය ඇතුළු ඓතිහාසික කෘති ප්‍රාථමික මූලාශ්‍රය ලෙසත්, හා විහාරය පිළිබඳ රචිත කෘති ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය කරන ලදි. බිතු සිතුවම් දෘශ්‍ය කලා මාධ්‍යයක් බැවින් ලබා ගත් දත්ත විශ්ලේෂණයේ දී එක් ක්‍රමවේදයකට පමණක් සීමා වීමට නො හැකි විය. එ බැවින් පර්යේෂණ දත්ත විශ්ලේෂණයේ දී තේමා විශ්ලේෂණය, රූපාර්ථ විශ්ලේෂණ ක්‍රමය හා ගුණාත්මක විශ්ලේෂණ ක්‍රමය භාවිත කර තිබේ.

## 03. සාකච්ඡාව

කතළුව පූර්වාරාමයේ පිළිම ගෙය මාල දෙකකින් යුක්ත ය. ඒ අතුළුමාලය හා පිටමාලය යි. ප්‍රදක්ෂිණා පථය නමින් හඳුන්වන පිටමාලයේ ඇතුළු බිත්තියේ සිට හැම බිත්තියක ම චිත්‍ර දක්නට ලැබේ. ප්‍රදක්ෂිණා පථයට අමතර ව විහාර මණ්ඩපයේත්, පිළිම ගෘහයේත් සිතුවම් ඇඳ තිබේ. චිත්‍ර ඇඳ ඇත්තේ බිත්තිය තීරු හතරකට බෙදාගෙන ය. එක් තීරුවක් වමේ සිට දකුණටත්, අනෙක් තීරුව දකුණේ සිට වමටත් නැවතත් තෙවන තීරුව වමේ සිට දකුණටත් කියවාගෙන යන අන්දමට සිතුවම් ඇඳ තිබේ. පහළ ම තීරුවෙන් අපාය සම්බන්ධ පුවත් වෙන වෙන ම රූප රාමු ලෙස දක්වයි. විහාර අභ්‍යන්තරයේ හිටි පිළිම, සැතපෙන පිළිම, හිඳි පිළිම සහ බෝධි සත්ත්ව පිළිම ද දැකගත හැකි ය. විහාර බිත්තිවල ඇති සිතුවම්වල අන්තර්ගතය අනුව ඒවා චිත්‍ර තේමා වසයෙනුත් වෙන් කර ගැනීමට හැකියාව ඇත. පූර්වාරාමයේ විහාර ගෙයි චිත්‍ර ඇඳ ඇත්තේ ගාල්ලේ කඩොල්ගල්ලේ සිත්තර පරම්පරාවේ 'මහ සිත්තරා' හා 'පොඩි සිත්තරා' යන දෙදෙනා ය. මහනුවර චිත්‍ර සම්ප්‍රදායේ ප්‍රධානියකු වූ දෙවරගල්පොළ සිල්වත් තැනගේ උපදෙස් හා මාර්ගෝපදේශ යටතේ හිරියාලේ හා

මූලාචාර්ය යන සිත්තරුන් දෙදෙනා 'මහ සිත්තරා' හා 'පොඩි සිත්තරා' නමින් පෙනී සිටි බවත්, කතළුගොඩ වැල්හේන්ගොඩ, මැදගොඩ හා වැල්ලද්දරගොඩ යන සිවු ගම්වැසියන් තරගයට සිතුවම් ඇන්දවූ බවත් පැවසේ (මහින්ද හිමි, 2007:89). උඩරට සිතුවම් සම්ප්‍රදාය හා පහත රට සිතුවම් සම්ප්‍රදාය යනුවෙන් මහනුවර යුගයේ සිතුවම් සම්ප්‍රදාය දෙකක් විහාරයේ චිත්‍රවලින් පිළිබිඹු වෙයි. කතළුව පූර්වාරාමයේ චිත්‍ර අධ්‍යයනයේ දී චිත්‍ර ශෛලීන් තුනක් හඳුනා ගත හැකි ය. එකම විහාරයක කලා ශෛලීන් තුනක් දක්නට ලැබීම මේ විහාරයේ ඇති සුවිශේෂ ලක්ෂණය යි.

පහත රට සිතුවම් ශෛලියේ මුල් අදියර නමින් පළමු කලා ශෛලිය දැක්විය හැකි ය. උඩරට චිත්‍ර ශෛලියේ පහත රට භාවිත වුණු මුල් අවස්ථාව මෙයින් අදහස් වේ. මේ ශෛලියේ විශේෂත්වය වන්නේ චිත්‍ර බොහෝ සෙයින් සරල වීම යි. කැලණි විහාරයේ ඇති මහනුවර යුගයේ චිත්‍රවලට සමාන ආකාරයෙන් සිතුවම් පහතරට ශෛලියේ මුල් අදියරට අයත් ය. නිදසුන් ලෙස මෙම විහාරයේ වෙස්සන්තර ජාතක කථාවේ සිතුවම් දැක්විය හැකි ය. තව ද මෙම චිත්‍රවල විචිත්‍ර බවක් දක්නට නැත. චිත්‍රාවකාශ සහිත ශෛලිය ලෙසත් සැරසිලි රහිත ශෛලිය ලෙසත් පහත රට ශෛලියේ මුල් අදියර තවදුරටත් හඳුනා ගත හැකි ය. මහනුවර චිත්‍ර සම්ප්‍රදායේ බහුලව භාවිත වුණු අඛණ්ඩ කථන ශෛලිය යොදාගෙන ඇති අතර ඇතැම් බිත්තියක තීරු හතරක් යටතේ මේ සිතුවම් ඇඳ තිබේ.

පහත රට ශෛලියේ දෙවන අදියර නමින් දෙවන කලා ශෛලිය දැක්විය හැකි ය. අතුරු සිදුරු නැති ව විස්තරාත්මක ව තොරතුරු ඉදිරිපත් කිරීමේ ක්‍රමය 'පහත රට ශෛලියේ දෙවන අදියර' ලෙස හඳුන්වයි. මේ ශෛලිය 'චිත්‍රාවකාශ රහිත ශෛලිය' ලෙසත්, 'සැරසිලි සහිත ශෛලිය' ලෙසත් හඳුනා ගත හැකි ය. මෙහි අවකාශවලට ඉඩ ඉතිරි කර ඇත්තේ බොහෝ ම අල්ප ව යි. සැරසිලි එකතු කරමින් හිස් අවකාශ පුරවා තිබේ (බලන්න, ඡායාරූප එලකය අංක 03). අතුළත විහාරයේ පිට බිත්තියේ ඇති මහධන සිටුතුමාගේ කථා පුවතේ දර්ශන මෙයට උදාහරණ වේ. මේ කථා පුවතේ හිස් අවකාශයට ඉඩක් දී නැති තරම් ය. සැරසිලි විශාල වසයෙන් යොදා ගෙන තොරතුරු විස්තරාත්මක ව ඉදිරිපත් කර තිබේ. මහධන සිටුතුමාගේ කථා පුවතේ ගෙවල කුලුනු, සිවිලිම්, සඳලුතල, ප්‍රවේශ දොරටු ආදිය පවා අලංකාරවත් ව කුඩා මෝස්තර යොදාගෙන හැඩගන්වා ඇති අයුරු දැක ගත හැකි ය (බලන්න, ඡායාරූප එලකය අංක 04, 05, 06). මේ අදියරේ දී මහනුවර යුගයේ වර්ණ භාවිතයටත් වඩා වර්ණ ප්‍රමාණයක් භාවිත කර තිබේ. උඩරට ශෛලියේ දී බහුල ව භාවිත කර ඇත්තේ රතු සහ කහ වර්ණ යි. ඒවාට කළු සහ සුදු වර්ණ එකතු කර අනෙක් වර්ණ සකසාගෙන තිබේ. බටහිර ආක්‍රමණ සිදුවුණු මේ සමයේ කෘත්‍රිම වර්ණ පවා මේ චිත්‍ර නිර්මාණයට යොදා ගන්නට ඇතැයි උපකල්පනය කෙරේ. එයට හේතුව වන්නේ පූර්වාරාමයේ චිත්‍රවල නීල වර්ණය මෙන් ම කොළ වර්ණය ද යොදාගෙන තිබීම යි. වර්ණ විවිධානුපාතයෙන් එකතු කර ගනිමින් අවශ්‍ය වර්ණ සකසා ගැනීමට සිත්තරුන් සමත් වී ඇති බව ද සිතුවම්වලින් කැපී පෙනේ. හැම සිතුවමක් වටා ම ඉතා ම සියුම් කළුපාට බාහිර රේඛාවක් භාවිත කර ඇත. මහනුවර යුගයේ චිත්‍ර පාර්ශ්වදර්ශී ලෙසත්, ඍජුදර්ශී ලෙසත් සැලකිය හැකි වුවත් මෙම චිත්‍රවල එවැනි රීතියකට අනුව මිනිස් රූප ඇඳ ඇති බවක් දක්නට නැත. එක් එක් පැත්තට ගැළපෙන සේ විවිධාකාර කෝණවලින් නිර්මාණය කර තිබේ. මිනිසුන්ගේ අනන්‍යතාව පැහැදිලි වන අයුරින්, චරිත ලක්ෂණ හඳුනා ගත

හැකි අයුරින් සහ භාවයන් පවා මතු වන අයුරින් මෙම සිතුවම් නිර්මාණය කර ඇත. මානව රූපවල චලනයන් පවා පියවි ස්වරූපයෙන් නිර්මාණය කර තිබේ.

තව ද වස්ත්‍රාභරණ දක්වා ඇත්තේ ඒ ඒ චරිතවලට, තනතුරුවලට ගැළපෙන ආකාරයෙන් ය. ලංකාවේ ගොඩනැගිලිවලට අමතර ව විදේශීය ගොඩනැගිලි ද මෙම චිත්‍රවල දක්නට ඇත. ගෘහාභ්‍යන්තර අවස්ථා දක්වන විට තද අඳුරු වර්ණ අඩුවෙන් යොදා ගෙන තාත්ත්වික තත්ත්වය මතු කිරීමට සමත් ව තිබේ. මෙහි දී කළුපාට සහ නිල්පාට පසුබිම් වර්ණ සඳහා යොදා ගෙන ඇත. හිස් අවකාශ පිරවීමටත්, අවස්ථානුරූපී ව සංකේත ඉදිරිපත් කිරීමටත් චිත්‍ර ශිල්පීන් විසින් නාරිලතා මල් රටා, මල්කම් මෝස්තර, ලියවැල් මෝස්තර, වාටි මෝස්තර, අන්නාසි මල සහිත සාම්ප්‍රදායික මෝස්තර, පලාපෙති මෝස්තර ආදිය යොදාගෙන තිබේ. සිවිලිම සරසා ඇත්තේ සියපත් රටාවලිනි. විහාර සිවිලිමෙහි, විහාරයට ඇතුළු වන දොරටු අභියස මාලාකර්ම, ලියවැල්, පලාපෙති ආදිය අලංකාර ව සිතුවමට ගෙන තිබේ. එමෙන් ම ගස්වල කොළ, ගෙඩි හා සත්ත්ව රූප හඳුනාගත හැකි අයුරින් සිතුවම් කර ඇත.

පහත රට සම්ප්‍රදායට ආවේණික ප්‍රකට ලක්ෂණ සහිත බිතුසිතුවම් අදියර නමින් තෙවන කලා ශෛලිය දැක්විය හැකි ය. ඉහතින් දෙවැනි ශෛලියේ දී හඳුන්වා දෙන ලද්දේ චිත්‍රාවකාශයට ඉඩ නො තබා සැරසිලි ආදියෙන් ඒවා පුරවමින් විස්තරාත්මක තොරතුරු දැක්වීමේ ක්‍රමය යි. පහත රට චිත්‍ර සම්ප්‍රදායට ආවේණික ලක්ෂණ සහිත සිතුවම් ශෛලිය හඳුනා ගැනීමට කතළුව පූර්වාරාමයේ සුතසෝම ජාතකය, චුල්ලධම්මපාල ජාතකය, පටාචාරා කතා පුවත දැක්වෙන සිතුවම් වැදගත් වේ. මෙම සිතුවම් දහනව වැනි සියවසේ මැද භාගයට අයත් බව විශ්වාස කෙරේ. පහත රට සම්ප්‍රදායේ සිතුවම්වල සැරසිලි භාවිත වී ඇත්තේ අලංකාර අයුරින් ය. හුදකලාව ඒවා තබා නැති අතර අවස්ථාව හෝ සිද්ධිය මතු වන අයුරින් ඒ සඳහා සැරසිලි යොදා තිබේ. මෙම සම්ප්‍රදායේ තවත් සුවිශේෂ ලක්ෂණයක් වන්නේ වස්ත්‍රාභරණ දැක්වීමේ දී ඒවාට සැරසිලි එකතු කිරීම යි. ඒවා චිත්‍රාකර්ෂණය වන අයුරින් කුඩා කුඩා මෝස්තර යොදමින් හැඩගන්වා තිබේ. ලංකාවට ආවේණික නො වන මල් මෝස්තර විශාල ප්‍රමාණයක් මේ වස්ත්‍රවල දක්නට ලැබේ. මාලිගාවල කුලුනුවල කැටයම් සරසිලිවලින් මතු කර තිබේ. මාලිගාවල පහන් දක්වා ඇත්තේ පිටරටින් ආනයනය කළ විදුලිපහන් ආකාරයෙන් ය. මහා සුතසෝම ජාතකයේ එල්ලෙන පහන් එයට උදාහරණ වේ. ඒවා බටහිර ලාම්පු ය. ගෙවල් අභ්‍යන්තරය මතු කිරීමේ දී තද කළු පාටත්, බාහිර දර්ශනවලට රතු පාටත් භාවිත කර ඇත. පටාචාරා කථාවස්තුවේ දී ස්වාභාවික ලෝකය මිනිස් ඇසට පෙනෙන ආකාරයෙන් සිතුවම් කර ඇත. ගස් වැල් දර්ශනය කිරීමේ දී කිතුල් ගසක් ද? අඹ ගසක් ද? පොල් ගසක් ද? යනුවෙන් හඳුනා ගත හැකි ආකාරයෙන් නිවැරදිව පෙන්වා දෙයි. සතුන්ගේ චර්යා, ඔවුන්ගේ ස්වාභාවික හැඩය පවා නිර්මාණය කර ඇත්තේ පියවි ස්වරූපයෙන් ය. මිනිස් රූප නිර්මාණය කිරීමේ දී දෙවැනි ශෛලියටත් වඩා සතුට, දුක, ශෝකය, කෝපය ආදී භාවමය ලක්ෂණ මතු වන ආකාරයෙන් නිරූපණය කිරීමට සමත් වී තිබේ. සිටු පවුලක ඉපදී, ගෙදර වැඩකාරයකු සමඟ නිවසින් රහසේ ගොස් විවාහ වී දරුවන් ලබා ජීවිතයේ දුක් පීඩාවලට මුහුණ දුන් ආකාරය දුක්ඛිත හැඟීමක් උපදවන ලෙස පටාචාරා කතා පුවත චිත්‍රණය කර තිබේ. විහාරයේ සිතුවම්වල ඇති චරිත හා සිද්ධි නිරූපණ අවස්ථා අනුව බෝධිසත්ව චරිතයේ දර්ශන, සිද්ධාර්ථ චරිතයේ දර්ශන, බුද්ධ චරිතයේ දර්ශන, බුද්ධකාලීන සමාජයේ පුද්ගල චරිත දර්ශන හෙවත් බෞද්ධ සාහිත්‍යාගත චරිත

දර්ශන සහ ලාංකේය ඉතිහාස කථා දර්ශන යනුවෙන් තේමා කිහිපයක් යටතේ වෙන් කර ගත හැකි ය.

බෝධිසත්ව චරිතයේ දර්ශන යටතේ තව්තිසා වැසි දෙවියන් මිනිස් ලොව උපදින ලෙස බෝධිසත්වයන්ට කරනු ලබන දේවතා ආරාධනය නිදසුන් ලෙස දැක්විය දැකි ය. සිද්ධාර්ථ චරිතයේ හා බුද්ධ චරිතයේ දර්ශන සඳහා පිළිමගෙයි පිටමාලය සම්පූර්ණයෙන් ම වෙන් වී තිබේ (බලන්න, ඡායාරූප එලකය අංක 07). මේ එක් එක් සිතුවම් හඳුනා ගැනීමට පාඨ දක්වා ඇත. උදාහරණ වසයෙන් 'සුද්ධෝදන රජහුගේ අග්‍ර මහේෂිකාව වූ මහාමායා දේවිය ස්වප්නයක් දැක එහි විපාක ඇසූ වග', 'උපන් සත් වැනි දින අහස වැඩ උන් බව', 'නැයින්ට ශිල්ප දැක්වීම', 'ස්නානය', 'මහාමායා දේවිය මහත් පිරිවරින් දෙව්දහ නුවරට යද්දී සල්ගස මුල දී බෝධිසත්ව තෙම බ්‍රහ්මයා අතට බිහිව පියුම් පිට සිට තමන් අග්‍ර බව ප්‍රකාශ කළ සේක' 'සිදුහත් කුමරු හා යශෝධරා දේවියගේ සරණ මංගල්‍ය', 'රාහුල කුමාරෝත්පත්තිය සැලවීමෙන් පසු සිදුහත් කුමරු මාලිගයට වැඩම කිරීම' යනාදිය දැක්විය හැකි ය. මෙවැනි පාඨ විසිහයක් යොදා ගෙන තිබේ. අනතුරු ව සිදුහත් කුමරු පැවිදි වීම, කිඹුල්වත් නුවර පිඬු සිඟා වැඩීම, ගෞතම බුද්ධ චරිතයේ වෙනත් විවිධ අවස්ථා සහ සූවිසි විවරණ දක්වා තිබේ.

බුද්ධකාලීන සමාජයේ පුද්ගල චරිත දර්ශන හෙවත් බෞද්ධ සාහිත්‍යාගත චරිත දර්ශන යටතේ බුදුරජාණන් වහන්සේ වැඩ සිටි සමයේ සිද්ධි ඇසුරින් එකල සමාජයට ආදර්ශයක් වසයෙන් පුද්ගල චරිත සිතුවම්වලට පාදක කරගෙන ඇත. එයින් ප්‍රබල ලෙස සමාජ ගත වුණු පුවතක් වන්නේ පටාචාරා කතාවයි. මෙම පුවත පූර්වාරාමයේ පමණක් නොව බොහෝ විහාරවල චිත්‍ර සම්ප්‍රදායේ බහුලව යෙදෙන්නෙකි. බුද්ධිමත් තීරණ නො ගෙන, දුරදිග නො බලා සිතට අවශ්‍ය අයුරින් කාමයට, රාගයට හැසිරීමට ඉඩදීම හා දෙමාපියන්ට අකීකරුවීම නිසා දුකට පත් වන ආකාරය මෙයින් මතු කර පෙන්වයි. නන්දිය උපාසකගේ කතා පුවත ද, සෝරෙය්‍ය සිටුවරයාගේ කතා පුවත ද මෙම විහාරයේ සිතුවම් කර තිබේ. විහාරයේ සිතුවමට නගා ඇති තවත් පුද්ගල චරිතයක් ලෙස මහධන සිටාණන්ගේ පුවත පෙන්වා දිය හැකි ය. මහධන සිටුතුමා නමින් හඳුන්වන්නේ බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටි සමයේ සිටි මහා ධනයක් හිමි සිටුවරයෙකි. දෙමාපියන්ට ධනය හා වස්තු සම්පත් තිබුණු නිසා තම එකම පුතා වූ මහාධන කුමාරයාට ගීත ගායනය, වාදනය ආදි සෞන්දර්යාත්මක හා විනෝදාත්මක ශිල්පය පමණක් ලබා දීමට කටයුතු කිරීමත්, එයින් විනාශයට පත් වීමත් මේ කතාවෙන් පෙන්වා දෙයි (බලන්න, ඡායාරූප එලකය අංක 08). යටත් විජිත යුගයේ ධනවත් සිංහල බෞද්ධ පවුල්වල දරුවන් මිථ්‍යාචාරවලට යොමු වීම නිසා එයින් ගලවා ගැනීම අරමුණු කොටගෙන මෙම සිතුවම් නිර්මාණය වූ බව සිතිය හැකි ය. මසුරුකමින් යුක්ත මිනිස් චරිත විවේචනය කිරීමට විහාර චිත්‍රවලට බහුලව එකතු කර ගත් කථා පුවතක් වන්නේ මසුරු සිටාණන්ගේ කතා පුවත යි. පූර්වාරාම චිත්‍ර ශිලපීන් ද විහාර බිතුසිතුවම් පෙළට මේ කතාව එකතු කර ගෙන තිබේ.

පූර්වාරාමයේ විහාර සිතුවම් අතර තවත් තේමාවක් වන්නේ ජාතක කථා දර්ශනය කිරීම යි. උඩරට පහතරට සෑම විහාරයක ම පාහේ ජාතක කථා සිතුවමට නගා තිබේ. පූර්වාරාමයේ ජාතක කථා සිතුවම් අතර ජාතක කථා හතක් ප්‍රධාන වසයෙන් දක්නට ලැබේ. වෙස්සන්තර ජාතකය විහාරයේ

දක්නට ලැබෙන වැඩිම සිතුවම් ප්‍රමාණයක් ඇති ජාතක කථාව යි. වෙස්සන්තර රජතුමා උපන් අවස්ථාවේ සිට දරුවන් දන් දෙන අවස්ථාව දක්වා සෑම සිතුවමකින් ම පාහේ සිදු කර ඇත්තේ දන්දීමේ අවස්ථා මතු කිරීම යි. ඒ අතර දරුවන් දන් දීමේ පුවත කෙරෙහි ශිල්පියාගේ වැඩි අවධානයක් යොමු වී තිබේ. වෙස්සන්තර ජාතකය සිතුවම් කර ඇත්තේ ප්‍රදක්ෂිණා පථයේ හෙවත් පිටමාලයේ බටහිර දිශාවේ බිත්තියේ ය. තීරු තුනක් එන ආකාරයෙන් හා එක ම කථා වස්තුවක දිගම සිතුවම් පෙළ ලෙස ද මෙය නිර්මාණය කර තිබේ. කථාව පටන් ගන්නේ වෙස්සන්තර කුමාරයා ලක්ෂයක් වටිනා ආභරණ නව වාරයක් කිරි මවුවරුන්ට දන් දුන්නැයි කියන පුවත දර්ශනය කරන සිතුවමකින් ය. එය දර්ශනය කර ඇත්තේ කුමාරයා ටික ටික ලොකු වන ආකාරය හා කිරිමවුවරුන් සිටින ආකාරය ද දක්වමිනි. දෙවැනි අවස්ථාවේ දක්වන්නේ වෙස්සන්තර කුමාරයා තරුණ වයසට පැමිණ මන්ද්‍රී දේවියත් සමඟ විවාහ ගිවිස ගන්නා අවස්ථාව යි. සඳමහ රජතුමා වෙස්සන්තර කුමාරයාට රාජ්‍ය පවරාදීම ඊළඟට දර්ශනය කර තිබේ. වෙස්සන්තර රජතුමා රජ වීමෙන් පසු දන් දෙන ආකාරය චිත්තාකර්ෂණීය අයුරින් ඉදිරිපත් කර තිබේ (බලන්න, ඡායාරූප ඵලකය අංක 09). දන්හලක මහා ඇතිලිවලින් දන් බෙදන ආකාරයත්, බමුණන් පවා පැමිණ දානය අරගෙන යන අවස්ථාත් සිතුවම් කර තිබේ. ඊළඟට ජාලිය ක්‍රිෂ්ණජිනා උපත ලැබූ බව පෙන්වයි. මේ අතරේ ම ඇළි ඇතු දන් දෙන අවස්ථාව ද නිරූපණය කර තිබේ (බලන්න, ඡායාරූප ඵලකය අංක 10). ඇළි ඇතු දන් දීමෙන් පසු ජනතාව රජතුමාට විරුද්ධ ව නැඟී සිටින ආකාරය, ජනතාවගේ හඬට වෙස්සන්තර රජතුමාගේ පියමහ රජ්ජුරුවෝ අවධානය යොමු කිරීම, වෙස්සන්තර රජතුමාට අවවාද දෙන ආකාරය පෙන්වීම, පියරජතුමාගේ අවවාදය පිළිපදින වෙස්සන්තර රජතුමා දරු දෙදෙනාත් සමඟ වංකගිරියට පිටත් වීම, යන අතරතුරේදීත් දන් දෙන සිදුවීම් නිරූපණය කිරීම, තමා ගමන් ගත් කරත්තයේ අශ්වයෝ දෙදෙනා දන් දීම, අනතුරුව දිව්‍ය පුත්‍රයෝ පැමිණ අශ්ව වේශයෙන් කරත්තය ඇදගෙන යාම, බමුණකුට රථය දන් දීම, රථය දන් දීමෙන් පසු වෙස්සන්තර රජතුමා පයින් ම චේතිය නුවරට යාම, වෙස්සන්තර රජතුමා ජාලිය කුමාරයා වඩා ගෙන යාම හා මන්ද්‍රී දේවිය ක්‍රිෂ්ණජිනා වඩාගෙන යාම, මේ දෙන්නාගේ ගමන දකින මහ ජනතාව දුකට පත්වීම යන අවස්ථා පිළිවෙළින් දක්වයි. අනතුරු ව දර්ශනය කරන්නේ චේතිය නුවර සිදුවීම් ය. චේතිය නුවර රජතුමා සහ දේවිය පිරිවර සමඟින් වෙස්සන්තර රජතුමාවත්, දේවියත්, දරු දෙදෙනාත් පිළිගන්නට පැමිණ සිටීම හා ඔවුන් බොහෝ ම වෙහෙසට පත්ව ඇති ආකාරය දැක්වීම, චේතිය රජ පවුල සහ වෙස්සන්තර රජ පවුල සතුටු සාමීචියේ යෙදෙන අයුරු ආදිය පිළිවෙළින් දක්වා තිබේ. ප්‍රභූ පවුලක ලක්ෂණ ඉහළින් ම මතු වන ආකාරයට මේ සිදුවීම් දර්ශනය කර ඇත. චේතිය රජතුමා වෙස්සන්තර රජතුමා සමඟත්, චේතිය රජුගේ දේවිය මන්ද්‍රී දේවිය සමඟත් කථා කරන අයුරු නිර්මාණය කර තිබේ. ජාලිය කුමාරයා පියරජතුමාගේ කකුල අල්ලගෙන සිටින ආකාරයත්, ක්‍රිෂ්ණජිනා මන්ද්‍රී දේවියගේ කකුල මත සිටින ආකාරයත් දක්වා තිබේ. චේතිය රටේ නැවතී රට පාලනය කරමින් සුවසේ ජීවත් වන ලෙස වෙස්සන්තර රජතුමාට චේතිය රජතුමා විසින් ආරාධනා කරන්නේ මේ අවස්ථාවේ දී ය. වෙස්සන්තර රජතුමා එයට ස්තුති කර නැවතත් වංකගිරිය දිසාවට පිටත් වී යාම දක්වයි. ඊළඟට දක්වන්නේ වංකගිරි අසපුවේ සිටින වෙස්සන්තර රජතුමා ය. ස්වාභාවික පරිසරයෙන් යුක්ත වනගත රමණීය පරිසරයත්, ගිරිශිඛර, දිය ඇළි ආදියත් මේ සමඟ ඉදිරිපත් කර තිබේ. රජතුමාත්, මන්ද්‍රී දේවියත්, දරු දෙදෙනාත් සුවසේ කාලය ගත කරන ආකාරය ද දක්වයි. අනතුරු ව දක්වන්නේ අමිත්තතාපා හා ජූජක බමුණා සිටින චිත්‍රයකි. එහි අමිත්තතාපා බැමිණිය නො සතුටින්

ඉන්නා ආකාරයත්, ජූජක බමුණා සමග කථාවේ යෙදෙන ආකාරයත් දක්වයි. එම සිදුවීමෙන් පසු ව ජූජක බමුණා වංකගිරියට යන ආකාරයත්, රටවැසියන් ජූජක බමුණාට කරන අපහාසත්, විරෝධතාත් දක්වයි.

වංකගිරියට පාර විමසුවත් මිනිසුන් නිවැරදි තොරතුරු නො දෙන ආකාරය දක්වා තිබේ. ජූජක බමුණා තවතවත් ඉදිරියට ගමන් කරන විට වැද්දෙකු හමුවීමත්, වැද්දාගේ හිරිහැරවලට හසු වී පසු ව ඔහුගේ සැලකිලි ලබා වංකගිරියට යන මාර්ගය අසා දැන ගැනීම, දරුවන් දන් දෙන අවස්ථාව, ජූජක බමුණාගේ සතුට, දරු දෙදෙනාගේ නො සතුට, දරු දෙදෙනා දුවගෙන ගොස් පොකුණේ සැඟවී යාම, පොකුණ සමීපයට එන වෙස්සන්තර රජතුමා දරු දෙදෙනාට කතා කර කරුණු පහදා දීම, ජූජක බමුණාට දරුවන් දන් දීම යන අවස්ථා දක්වා තිබේ. අනතුරු ව දක්වන්නේ මන්ද්‍රි දේවිය හඬා වැලපීම හා ජූජක බමුණා දරු දෙන්නාට වද දෙමින් ගෙනියන ආකාරය යි. දෙවිවරු ජූජක බමුණාගේ මාර්ගය සඟවා වෙනත් මාර්ගයකට පැමිණීමට සලස්වා සඳමහ රජතුමාගේ රාජ්‍යයට පැමිණීමට කටයුතු කරවීම, රටවාසීගෙන් රජතුමාට පණිවිඩය ලැබීමට සැලැස්වීම හා ජූජක බමුණාත්, දරු දෙදෙනාත් මාලිගයට ගෙන්වාගෙන දරුවන් තරාදියක දමා බර කිරා එම බරට සරිලන රන් කාසි ජූජක බමුණාට දන් දීම, දෙදෙනා නිදහස් කර ගැනීම, බමුණා දැඩි තණ්හාවෙන් රන්කාසි දිහා බලාගෙන ඉන්න ආකාරය පිළිවෙළින් සිතුවම් කර තිබේ. අනතුරු ව සඳමහ රජතුමා රාජකීය පෙරහැරින් වංකගිරියට යාමත්, මේ අතරේ වෙස්සන්තර රජතුමා මහලු මගියාට මන්ද්‍රි දේවිය දන් දීමත් සිදු වේ. සඳමහ රජතුමා වංකගිරියට පැමිණ වෙස්සන්තර රජතුමා සමඟ නැවතත් නුවර බලා පිටත් වී එන අවස්ථාවෙන් වෙස්සන්තර ජාතක කථාවේ සිතුවම් නිමාවට පත් වේ. විහාරයේ සිතුවම් අතර ඇති තවත් ජාතක කථාවක් වන්නේ සුතසෝම ජාතකය යි. මාංස භක්ෂණයේ ගිජු වූ රජකු මිනී මස් කන අන්දම වස්තු විෂය කර ගත් කථාවක් මෙහි ඇතුළත් වේ. චුල්ලධම්මපාල ජාතකය ද පූර්වාරාම විහාරයේ සිතුවම් කර තිබේ. දුෂ්ට ක්‍රියා විවේචනය කිරීම මෙහි අරමුණ වී ඇත. බණ්ඩභාල ජාතකය ද විහාර සිතුවම් අතරට එකතු කර ගෙන තිබේ. යමෙක් අල්ලස් ගැනීම, දූෂණය, වංචාව ආදි අවගුණ ක්‍රියාත්මක කළත් අවසානයේ දී ඔවුන්ට පරාජය හිමි වන බවත්, සත්‍ය ජයග්‍රහණය කරන බවත් පෙන්වා දීම මේ කතා පුවතේ අරමුණ වී ඇත. මහනුවර යුගයේ ජාතක සිතුවම් අතර බණ්ඩභාල ජාතකය සිතුවම් කර ඇත්තේ මේ විහාරයේ පමණක් වීම ද විශේෂත්වයකි. තේමිය ජාතකය ද විහාර සිතුවම්වලට යොදා ගත් ජාතක කථාවකි. මිනිසුන් කරන වැරදිවලින් ඇත් කර අපාය පිළිබඳ බිය ඇති කර දෙලොව ම සාර්ථක කර දීමට යොදා ගත් ජාතක කථාවක් වසයෙන් ද මේ ජාතක කථාව සැලකිය හැකි ය (බලන්න, ඡායාරූප ඵලකය අංක 11, 12). තේමිය ජාතකයෙන් කියා දෙන්නේ අධිෂ්ඨානයේ හා බ්‍රහ්මචර්යාවේ මහිමය යි. පූර්වාරාමයේ සිතුවම් අතර දැක ගත හැකි තවත් වැදගත් ජාතක කථාවක් වන්නේ නිමි ජාතකය යි. අපාය විස්තර ඉදිරිපත් කිරීම මේ ජාතක කථාවේ අරමුණ බවට පත් වී තිබේ.

මේ ආකාරයෙන් පූර්වාරාමයේ බිතුසිතුවම්වලින් පුද්ගල ජීවිතය සාර්ථක කර දෙමින් පරලොව ජීවිතය සුගතිගාමී කරදීමට උපදෙස් රැසක් සිතුවම්වලින් සමාජ ගත කර තිබේ. ගැටුම්වලින් තොර පවුල් ජීවිතයක්, සමාජයක් මෙන් ම අන්‍යෝන්‍ය සම්බන්ධතා පවත්වා ගැනීමක් ද අරමුණු කර ගෙන ඇත. ඒ වෙනුවෙන් සිතුවම් සියල්ල ම පාහේ නිර්මාණය වී තිබේ. පූර්වාරාමයේ සිතුවම්වලින් බටහිර ආධිපත්‍ය යටතේ දකුණු පළාතේ පැවැති සමාජය, සංස්කෘතිය, ආර්ථික, දේශපාලනික මෙන් ම

ආගමික පරිසරයත් හඳුනා ගත හැකි ය. යුරෝපීය සංස්කෘතියේ ලක්ෂණ සමූහයක් සිතුවම්වලට යොදා ගෙන තිබේ.
ඒ අතර ඇතුළු ගර්භයට ඇතුළු වන මකර තොරණේ වික්ටෝරියා රැජිනගේ හා ජෝජ් රජුගේ රූපත්, ඉංග්‍රීසීන්ගේ රාජ්‍ය ලාංඡනයත් සිතුවම් කර තිබීම, පටාචාරා කතා පුවතේ පටාචාරා මෙහෙණිය නැවට නංවා ගැනීමට කටයුතු කරන පුද්ගලයා හා නැවියා යන දෙදෙනා ම යුරෝපීය ඇඳුම් කට්ටලයක් ඇඳ යුරෝපීය හිස්වැසුම් ලාගෙන සිටීම, මහධන සිටුවරයාගේ කතා පුවතේ සිතුවම්වල යුරෝපීය ආභාසය මැනවින් ඉස්මතු කිරීම හා එහි අත් දිග කෝට් එකකින් සැරසුණු මහධන සිටුවරයා සහ ප්‍රියසම්භාෂණයේ යෙදෙන කාන්තාවන් යුරෝපීය ගවුම් ඇඳ සිටීම, චිත්‍රවල ඇති මාලිගා එංගලන්තයේ පැරණි ගෘහනිර්මාණ ශිල්පය මතු වන ආකාරයෙන් ඇඳ තිබීම, තව ද සංගීත භාණ්ඩ-යුරෝපීය හැඩය ගත් නිවාස දක්නට ලැබීම, මහධන සිටුතුමාගේ දේවියගේ අතේ ලේ බී සිටින මදුරුවෙක් සහ ලේ නො බී සිටින මදුරුවන් දෙදෙනෙකු සිතුවමට නගා තිබීම, විහාරයට ප්‍රවේශවීමේ දී අනුරාධපුර හා පොලොන්නරු ආදි යුගවල දී ප්‍රවේශ දොරටුව සමීපයේ නාගරාජ රූපය, පුන්කලස් ආදියෙන් යුක්ත මුරගල් හෙවත් දොරටුපාල රූප පිහිටුවීම සිදු වුවත් සමාජ හා සංස්කෘතික වෙනස්වීම් අනුව විහාරාරක්ෂකයන් හෙවත් දොරටුපාලයන් වසයෙන් යුරෝපීය හමුදා නිල ඇඳුමින් සැරසී කඩුවක් හා තුවක්කුවක් අතැතිව දුම් පයිප්පයක් උරමින් සිටින යුදභටයන් චිත්‍රයට නැගීම ආදිය පෙන්වා දිය හැකි ය. බුදුරජාණන් වහන්සේගේ ආරක්ෂාවට ආයුධ සන්නද්ධ සෙබළුන් යොදවා ඇති ආකාරය දක්වා ඇත්තේ එකල බටහිර සමාජ, සංස්කෘතික පරිසරයේ බලපෑම අනුව ය. ඉංග්‍රීසි හේවායෝ තුවක්කු අතින් අරගෙන දුම් පයිප්ප උරමින් සිටීම එකල බහුල දර්ශනයක් වන්නට ඇත. පන්සල් ආශ්‍රිතව ද සෙබළුන් සිටි නිසා මෙවැනි සිතුවම් විහාරයට එකතු වූවා විය හැකි ය. තව ද ඉංග්‍රීසි අකුරින් 'PURWARAME' යන්න ද සඳහන් කර තිබීම ද එකල භාෂාවේ ප්‍රමුඛත්වය ඉංග්‍රීසියට හිමි වූ බව නිරූපණය කරන්නෙකි (බලන්න, ඡායාරූප එලකය අංක 13). මහනුවර යුගයේ විහාරයක ඉංග්‍රීසි අක්ෂර භාවිත වුණු එක ම අවස්ථාව ද මෙය වේ. යුරෝපීය සංස්කෘතියක ජීවත් වූ ශිල්පියා ඔහුට අත්දකින්නට ලැබුණු යුරෝපීය සංස්කෘතියේ දුම්පයිප්ප, හමුදා නිලඇඳුම්, ස්ත්‍රීන්ගේ ආභරණ හා වස්ත්‍ර, බටහිර තූර්ය භාණ්ඩ, රෝම ඉලක්කම්, බිත්ති ඔරලෝසු, චිමිනිලාම්පු හා යුරෝපීය ගෘහභාණ්ඩ ආදිය චිත්‍රවලට යොදා ගෙන තිබේ. සමාජ පරිසරයේ බලපෑම මත චිත්‍ර ශිල්පියා මේවා යොදා ගන්නට ඇතැයි ද විශ්වාස කළ හැකි ය.

පූර්වාරාම පිළිම ගෘහයේ චිත්‍ර හැරුණු විට තවත් වැදගත් දෙයක් වන්නේ බුද්ධ ප්‍රතිමා, ශ්‍රාවක ප්‍රතිමා, දේව ප්‍රතිමා ආදිය යි. විහාරයට ප්‍රවේශ වීමේ දී මකර තොරණ දෙකක් හමු වේ. එයින් එකක වික්ටෝරියා මහ රැජිනගේ රූපය නිර්මාණය කර ඇත (බලන්න, ඡායාරූප එලකය අංක 14). එංගලන්තයේ මහ රජතුමාගේ රූපය සමඟ එරට රාජ්‍ය ලාඤ්ජනය අනෙක් මකර තොරණේ ඇඳ තිබේ. විෂ්ණු-කතරගම දේවතා රූප, මල් අතින් ගත් ශ්‍රාවක රූප, හංසපූට්ටුව, සිංහ රූප දෙකක්, කිඳුරු යුවළකගේ රූපයක් ද වේ. (බලන්න, ඡායාරූප එලකය අංක 15, 16, 17). වම්පස බිත්තිය වෙන් කර ඇත්තේ බෝධිසත්ත්ව ප්‍රතිමාවක් සඳහා යි. සිවිලිම මට්ටමට ම එය උසින් යුක්ත ය (බලන්න, ඡායාරූප එලකය අංක 18). දෙපස සක් පිඹින්නන් දෙදෙනකුගේ සිතුවම් දක්නට ලැබේ. (බලන්න, ඡායාරූප එලකය අංක 19). මේ සක්පිඹින සිතුවම් පහත රට චිත්‍ර කලාවට ආවේණික ලක්ෂණයකි. මේ ප්‍රතිමාව දෙපස ම දොරටුපාල රූප වසයෙන් ආරක්ෂක රූප හතරක් තිබේ. විශාල සැතපෙන

බුද්ධ ප්‍රතිමාවක් ද සමාධි ප්‍රතිමා ද විහාර ගෙයි දක්නට ලැබේ (බලන්න, ඡායාරූප ඵලකය අංක 20). මේ මූර්ති නිර්මාණ මහනුවර යුගයේ කලා ලක්ෂණ මතු කරයි.

## 04. සමාලෝචනය

මහනුවර යුගයේ පහත රට චිත්‍ර සම්ප්‍රදායට අයත්, දහඅට වන, දහ නවවන සියවස්වල කාලීන තොරතුරු මතු කරන සිතුවම්වලින් පිරුණු කලාගාරයක් ලෙස කතළුව පූර්වාරාමය හඳුනා ගත හැකි ය. ලක්දිව මුහුදුබඩ ප්‍රදේශවල පිහිටි විහාරස්ථාන යටත් විජිත සමයේ නඩත්තු නො කිරීම නිසා මුල් කලා කෘතිවලට හානි වී විනාශ වී තිබේ. මෙම විහාරයේ කලා කෘතිවලට ද එම තත්ත්වය උදා වී ඇති අතර ක්‍රි.ව. 1880 දී එංගලන්තයේ ජෝජ් රජු හා වික්ටෝරියා මහරජින ඇතුළු පිරිසක් විහාරය දැක බලා ගැනීමට පැමිණීමෙන් පසු ඔවුන්ගේ අනුග්‍රහයෙන් ගොඩනැඟිලි හා කලා කෘති ප්‍රතිසංස්කරණය කර තිබේ. එය සිහි කිරීම සඳහා විහාර මන්දිර ප්‍රවේශ දොටුවේ සහ බුද්ධ මන්දිර ප්‍රවේශ දොරටුවේ ජෝජ් රජතුමාගේ සහ වික්ටෝරියා රැජිනගේ මුහුණු සිතුවම් කර තිබේ. පූර්වාරාමයේ සිතුවම්වලින් මහනුවර යුගයේ චිත්‍ර සම්ප්‍රදායේ සෑම ශෛලියක් ම පාහේ අධ්‍යයනය කළ හැකි ය. දකුණට අනන්‍ය චිත්‍ර සම්ප්‍රදායක ලක්ෂණ තවමත් හොඳින් ආරක්ෂා වී ඇති සිතුවම් සහිත විහාරයක් ලෙස කතළුව පූර්වාරාමයේ සිතුවම් සැලකිය හැකි ය. මෙම විහාරයේ සිතුවම් අධ්‍යයනය කිරීමෙන් යටත් විජිත සමයේ සමාජ සංස්කෘතික තොරතුරු රාශියක් අනාවරණය වේ. විහාරයේ සිතුවම් කර ඇති ජාතක කථාවල සහ පුද්ගල චරිත කථාවල තේමාවලින් ද සිතුවම්වලින් ඇති වස්ත්‍රාභරණ, ගොඩනැඟිලි, පරිසරය ආදී භෞතික සාධකවලින් ද ඒ බව තහවුරු වේ. සිතුවම් කලාව අධ්‍යයනයට අමතර ව සමාජ විද්‍යාත්මක හා ඓතිහාසික තොරතුරු අධ්‍යයන කරන පර්යේෂකයන්ට මෙම විහාරයේ සිතුවම් අතිශයින් ම වැදගත් වේ.

පූර්වාරාමයේ සිතුවම්වලින් යටත්විජිත යුගයේ සමාජ හා සංස්කෘතික තොරතුරු රාශියක් අනාවරණය කර ගත හැකි ය. ඒ අනුව මහධන සිටුතුමාගේ කතා පුවතින් කාලීන සමාජයේ උත්සව පැවැත් වූ ආකාරය, මිනිසුන් නටන, ගයන ආකාරය, ඒ උත්සවවලට භාවිත කළ සංගීත භාණ්ඩ ආදියත් හොඳින් හඳුනාගත හැකි ය. සමකාලීන ප්‍රභූ පන්තිය, යුරෝපීය ඇඳුම් පැලඳුම් භාවිත කිරීම, යුරෝපීය ජාතින් ගෙවල ගත කළ ආකාරය, එම ගෙවල ගෘහ භාණ්ඩ ආදිය දක්වමින් ඔවුන්ගේ සුඛෝපභෝගී ජීවිතය ද මෙම කතා පුවතේ සිතුවම්වලින් මතු වී පෙනේ. රැවුල් වවා ගත්ත මහධන සිටුතුමා කෝට් එකක් හා දිග කලිසමක් ඇඳගෙන, තොප්පියක් හිස පැලඳගෙන බටහිර සංගීත භාණ්ඩයක් (Drums) වාදනය කරමින් නටන අයුරු දක්වා තිබේ. සිටුදේවියත් එයට තාලය එකතු කරමින් වියෝනාවක් වාදනය කරන බව පෙන්වයි. කපිරිඤ්ඤා ඇඳුම්වලට සමාන ඇඳුම් ඇඳගෙන සිටුමැඳුරේ සිටින අනෙක් අයත් සංගීත භාණ්ඩ වාදනය කරමින් එයට එකතු වී සිටින අයුරු දක්වයි. මේ චිත්‍රවල එන ගෘහ නිර්මාණ සැරසිලිවලට බහුල ව යොදාගෙන ඇත්තේ විදේශීය මෝස්තර යි. ගෘහ භාණ්ඩ දැක්වීමේ දී ලාම්පු, පුටු ආදිය විදේශීය ක්‍රමයට දක්වයි. මෙම කතා පුවතින් අනාවරණය කිරීමට උත්සාහ ගෙන ඇත්තේ යටත් විජිත යුගයේ පහත රට සමාජයේ ස්වභාවය යි. ධනය හිමි බෞද්ධ පවුල්වල තරුණයන් විනෝදයටත්, මිථ්‍යාචාරයටත් යොමු වී විනාශයට පත් වන ආකාරය මතු කිරීම මේ කතා පුවත ඉදිරිපත් කිරීමේ අරමුණ බවට පත් ව තිබේ. සෝරෙය්‍ය සිටුවරයාගේ කතා පුවතින් මතු කර පෙන්වා දෙන්නේ තමාගේ සිත තමාගේ පාලනයෙන් ගිලිහී ගොස් විපත්වලට

මුහුණ දෙන ආකාරය යි. එය සසරින් මිදීමට බාධාවක් වන බවත්, යටත් විජිත සමාජයේ පැවැති සුරාවෙන් හා සූදුවෙන් පිරුණු විනෝදකාමී ජීවිතයත් ප්‍රතික්ෂේප කොට, බෞද්ධයන් එයින් මුදවා ගෙන යහපතෙහි යෙදවීම අරමුණු කරගත් සිතුවම් සමූහයක් ලෙස සෝරෙය්‍ය සිටුවරයාගේ කතාපුවතට අදාළ සිතුවම් හඳුනා ගත හැකි ය. දන් දීමේ වැදගත්කමත්, තණ්හාවෙන් ඈත්වීමේ වටිනාකමත් පෙන්වා දීම අරමුණු කරගෙන මච්ඡරිය කෝසිය සිටුතුමාගේ පුවත සිතුවමින් ඉදිරිපත් කරන්නට ඇති බව නිගමනය කළ හැකි ය. විදේශීය බලපෑම නිසා ධර්මයෙන් හා දන් පින්කම් කිරීමෙන් ඈත් වන බෞද්ධයන් ආරක්ෂා කර ගැනීමත්, ඔවුන් පස්පවින් වළක්වා යහපතෙහි යෙදවීමත් අරමුණු කරගෙන නන්දිය උපාසකගේ කතා පුවත විහාර සිතුවම් පෙළට යොදා ගන්නට ඇතැයි ද උපකල්පනය කළ හැකි ය. සුතසෝම ජාතක කථාව විහාරගෙයි සිතුවමට නැඟීමෙන් චිත්‍ර ශිල්පියා අපේක්ෂා කර ඇත්තේ පංචශීලයේ පළමු ශික්ෂා පදය ආරක්ෂා කිරීමේ වැදගත්කම යි. එමෙන් ම එකල සමාජයේ බහුල ව ව්‍යාප්ත වුණු ගව ඝාතනය, සූදුව, සුරාව ආදිය හෙළා දකිමින් ප්‍රතික්ෂේප කිරීමක් ද මේ සිතුවම්වලින් සිදු කර තිබේ. චුල්ලධම්මපාල ජාතකය සිතුවම් කිරීමෙන් අපේක්ෂා කර ඇත්තේ පාලකයකුගේ දුෂ්ට ක්‍රියා විවේචනය කිරීමකි. බටහිර ආධිපත්‍ය ක්‍රියාත්මක වූ සමයේ කාලීන අවශ්‍යතාවක් මතු කිරීමට ගත් උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස ද මෙම ජාතක සිතුවම් පෙළ අගය කළ හැකි ය. සමකාලීන සමාජයට මෙන් ම අනාගතයටත්, පුද්ගල ජීවිත මෙලොව හා පරලොව වසයෙන් සාර්ථක කර ගැනීම, අධිෂ්ඨානශීලි ව කටයුතු කිරීම, පාපයෙන් වැළකී සිටීම අරමුණු කරගෙන තේමිය ජාතකය සිතුවම් කර ඇති බව සිතිය හැකි ය. විහාරයේ ඇති සිතුවම් සියල්ලෙන් ම පාහේ චිත්‍ර ශිල්පියා පෙන්වා දීමට උත්සාහ ගෙන ඇත්තේ දුෂ්ක්‍රියාවලින් වැළකී යහපත් ලෙස කටයුතු කිරීමේ වටිනාකම යි. බෞද්ධ සංස්කෘතියට අනුව ජීවත් වීමේ වැදගත්කමත්, පර සිරිත් ප්‍රතික්ෂේප කර රට වැසියා දුරාචාරයෙන් වළක්වා ගැනීමත් අරමුණු වූ බව නිගමනය කළ හැකි ය.

## පරිශීලිත මූලාශ්‍රය


අමරතුංග, විජයසිරි. (1993). *ශ්‍රී ලංකාවේ චිත්‍ර හා මූර්ති.* ආරිය ප්‍රකාශකයෝ.

අමරමෝලි හිමි, වේරගොඩ. (1961). *පන්සිය පනස් ජාතක පොත.* ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනම.

උල්ලුවිස්හේවා, පී., (1993). *උඩරට බිතුසිතුවම් මග.* රජයේ මුද්‍රණාලය.

කුමාරරත්න, සිරි විජය. (2005). *දහඅටවන සියවසේ බිතුසිතුවම්.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

චාර්ල්ස්, එස්.පී., (2000). *පාරම්පරික සිංහල බිතු සිතුවම්.* මධ්‍යම සංස්කෘතික අරමුදල.

දිසානායක, ජේ.බී., (1988). *සිංහල වෙහෙර විහාර.* ලේක්හවුස් මුද්‍රණාලය.

ධර්ම ශ්‍රී, කතළුවේ., (1983). රත්නප්‍රභා. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව.

බිනරගම, දයානන්ද. (2008). *මහනුවර යුගයේ බෞද්ධ කලා සම්ප්‍රදාය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

(ප්‍රාචීන භාෂෝපකාර සමාගම). සංස්. (2015). *සද්ධර්මරත්නාවලිය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බෝපිටිය, පවිත්‍රා මධුභාෂී. (2016). *මහනුවර යුගයේ චිත්‍ර කලාව.* සූරිය ප්‍රකාශකයෝ.

මහින්ද හිමි, උණුවතුර බුබුලේ. (2007). *දකුණේ විහාරවල මහනුවර සම්ප්‍රදායේ චිත්‍ර.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මහින්ද හිමි, උණුවතුර බුබුලේ. (2013). *ලක්දිව බෞද්ධ චිත්‍ර කලා ඉතිහාසය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රත්නායක, දර්ශන. (2009). *මහනුවර චිත්‍ර සම්ප්‍රදාය සහ සමාජය.* සූරම්‍ය ප්‍රකාශන.

විජේසේකර, නන්දදේව. (1964). *පැරණි සිංහල බිතු සිතුවම්.* ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

විනීවිතාරණ සහ තවත් අය. (1957). *සාහිත්‍යය.* සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.

සෝමතිලක. එම්., (2002). *මහනුවර සම්ප්‍රදායේ බෞද්ධ බිතුසිතුවම් කලාව.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

## ඡායාරූප

(කතළුව පූර්වාරාමයේ පිළිම ගෙහි බිතු සිතුවම්වල ඡායාරූප ඉදිරිපත් කර ඇත්තේ 2024.03.01 දින සිදු කළ ක්ෂේත්‍ර අධ්‍යයනය ඇසුරිනි.)



1.

කතළුව පූර්වාරාමය පිළිමගෙය



2.

එංගලන්ත මහරජු ජෝජ් සහ එරට රාජ්‍ය ලාංඡනය



3.

බිත්ති සැරසිලි




4.

ප්‍රවේශ දොරටු සැරසිලි රටා




05.

කුලුනු සැරසිලි රටා




06.

සිවිලිම් සැරසිලි රටා



07.
සිද්ධාර්ථ කුමාරයා පැවිදි වීම



08.
මහධන සිටුවරයාගේ කතා පුවතේ සිතුවමක්



9.
දන්හල් පැවැත්වීම (වෙස්සන්තර ජාතකය)



10.
ඇළි ඇතු දන් දීම (වෙස්සන්තර ජාතකය)



11.
අපාය සිතුවමක් (තේමිය ජාතකය)



12.
අපාය සිතුවමක් (තේමිය ජාතකය)




13.
ඉංග්‍රීසි අකුරින් 'PURWARAME' ලෙස සඳහන් කිරීම,
වික්ටෝරියා මහ රැජින සහ එරට රාජ්‍ය ලාඤ්ඡනය




14.
වික්ටෝරියා මහ රැජින සහ එරට රාජ්‍ය ලාඤ්ඡනය සහිත මකර තොරණ



15.
විෂ්ණු දේවතා රූපය




16.
හංසපූට්ටුව



17.
කිඳුරු යුවළ



18.
බෝධිසත්ත්ව ප්‍රතිමාව



19. සක් පිඹින්නන් දෙදෙනාගෙන් එක් රූපයක්



20.
පිළිමගෙයි සමාධි බුද්ධ ප්‍රතිමාව හා සැතපෙන බුද්ධ ප්‍රතිමාව